**ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 15 දින ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජෛව වත්කම්,පරිගනක මෘදුකාංග,ඉන්ධන පිරවුම්හල් ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර සහ වෙළෙඳ මධ්‍යස්ථානවලට අදාලව එකතු වටිනාකම රු.මිලියන 468.62 ක් වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | ගිණුම් ගත කිරීමේ කටයුතු සිදු කරන බව දක්වා තිබුණි. |
| (ආ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන ගිනි නිවීමේ උපකරණ රු.මිලියන 5.291 කට අලෙවි කර ලද ආදායම වත්කම් ගිණුමට බැර කිරීම හා ඊට අදාළ ගැලපීම් නොකිරීම නිසා එම වටිනාකමින් මුළු වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | ඉදිරියේදී ආරම්භක ශේෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව දක්වා තිබුණි. |
| (ඇ) | යුද්ධ හමුදාව සතු ඉඩම් කොටස් 160 ක ප්‍රමාණයක් මෙතෙක් තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | හමුදාව සතු ඉඩම් කඩිනමින් හඳුනාගෙන තක්සේරු කර ගිණුම් ගත කල යුතුය. | තක්සේරු කටයුතු අවසන් වූ පසු ගිණුම්ගත කරන බව දක්වා තිබුණි. |

**1.6.2 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය යටතේ ඇති ගොඩනැගිලි සහ ඉදිකිරීම් තුල වෙනත් වත්කම් ලෙස රු. මිලියන 2,590 හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ වෙනත් වත්කම් ලෙස රු.මිලියන 111.22 ක් දක්වා තිබුණු අතර එයින් නිරූපණය වන වත්කම් පිළිබඳ උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ වූ වෙනත් වත්කම් සඳහා විස්තර වාර්තාවක් ඉදිරියේදී ඉදිරිපත් කරන බවටත්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ වූ වෙනත් වත්කම් වර්ෂ කිහිපයක සිට ආරම්භක ශේෂයක් වශයෙන් ඉදිරියට |

| | | | |
|---|---|---|---|
| | | | රැගෙන එන ලද වටිනාකමක් බවත් දක්වා තිබුණි. |
| (ආ) | රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අංක mod/dev/rvsa/61/2012 දරන සහ 2012 ජූලි 19 දිනැති ලිපියේ පොදු කොන්දේසි 07 ට අනුව 2017 ,2018 වර්ෂයන් සඳහා මුළු දීමනා ලාභීන්ගෙන් හා 2019 මුල් අර්ධ වර්ෂයේ දීමනා ලාභීන් 122,699 ක ගෙන් ජීව දත්ත වාර්තා ලබා නොගෙන රණවිරු මාපිය රැකවරණ දීමනාව ලෙස රු.මිලියන 3,297.03 ක් ගෙවා තිබුණි. | ගෙවීම් කිරීමට ප්‍රථම ජීව දත්ත වාර්තා ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. | ලිපියේ පොදු කොන්දේසි පිළිබඳව යුධ හමුදා සියලු ස්ථාන සහ සියලුම රෙජිමේන්තු මධ්‍යස්ථාන දැනුවත් කිරීමට කටයුතු කළ බවත්, ජීව දත්ත වාර්තා ඉදිරිපත් නොකල අයවලුන්ගේ දීමනාව අත්හිටුවීමට උපදෙස් ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල 2019 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු. මිලියන 195.88 ක් විය. | මුදල් රෙගුලාසි 373 ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිරවුල් කිරීමට පියවර ගනිමින් පවතින බව දක්වා තිබුණි. |
| (ආ) | 2008, 2011, 2017 සහ 2018 යන වර්ෂවලට අදාලව නොපියවන ලද අග්‍රිම ශේෂ පිළිවෙළින් රු. මිලියන 2.81 ක්, රු. මිලියන 2.65 ක්, රු.මිලියන 3.46 ක් හා රු. මිලියන 9.18 ක් සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. | නිරවුල් කිරීමට පියවර ගනිමින් පවතින බව දක්වා තිබුණි. |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2019 වර්ෂයේ අවස්ථා 05 කදී මුදල් රෙගුලාසි 66 මගින් රු. මිලියන 3,297.07 ක් වැය විෂයන් 12 ක් සඳහා ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණු අතර, අවස්ථා 04 කදී රු.මිලියන 3,153.80 ක් පරිපූරක ඇස්තමේන්තු අනුමත කර ගෙන තිබුණි. | අයවැය ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | වාර්ෂික අවශ්‍යතාවය මත පරිපූරක ඇස්තමේන්තු සහ මු.රෙ.66 මගින් ප්‍රතිපාදන මාරු කර ගැනීම් සිදුකල බව දක්වා තිබුණි. |
| (ආ) | වැය විෂයන් සඳහා වූ ප්‍රතිපාදනයන් කාර්යක්ෂමව මෙහෙයවා නොතිබීම මත ප්‍රතිපාදනයන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. සියයට 10 කට වැඩි එවැනි ඉතිරිවීම් සහිත වැය විෂයයන් 35 ක් පැවතුණු අතර එහි වටිනාකම රු.මිලියන 11,111.66 ක් විය. | ප්‍රතිපාදනයන් කාර්යක්ෂමව මෙහෙය විය යුතුය. | වැය විෂයන් 18 ක් සඳහා බිල්පත් නිරවුල් කිරීමට ගෙවීම් කාර්යාලවලට ඉදිරිපත් කර තිබුණද, මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි ද්‍රවශීල මුදල් නොලැබුණු බව දක්වා තිබුණි. |
| (ඇ) | ඉන්දියානු ණය මාලාව යටතේ වැය විෂයය අංක 2 ක් සඳහා රු. මිලියන 1,500 ක් සහ රු. මිලියන 225 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් එම වැය විෂයන්හි වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි. | සැලසුම් කළ පරිදි ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. | පාස්කු ප්‍රහාරය හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු වසර තුළ නිම කිරීමට නොහැකි වූ බව දක්වා තිබුණි. |
| (ඈ) | වැය විෂයන් 07 ක් සඳහා ප්‍රතිපාදනය රු. මිලියන 4,659.60 ක් හා පරිපූරක ප්‍රතිපාදනය රු. මිලියන 604.70 ක් වූ අතර මුළු වියදම රු. මිලියන 3,266.66 ක් වුයෙන් ඇස්තමේන්තු ගත මුදලින් රු. මිලියන 1,997.64 ක ඉතිරිවීම් තිබුණු අතර ඉන් පරිපූරක ප්‍රතිපාදනය වූ රු. මිලියන 604.70 ම ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන වාර්ෂික අවශ්‍යතාවය මත වෙන් කර ගැනීමේදී එය උපයෝජනය සඳහා උපාය මාර්ගික සැලසුම් නියමිත කාලය තුල සකස් කිරීම,ඒවා නිසි කලට ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම. | ද්‍රවශීල මුදල් ප්‍රමාණවත් පරිදි ලබා නොදීම හේතුවෙන් බිල්පත් නිරවුල් කිරීමට නොහැකි වූ බව දක්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පාකිස්ථානු ණය මාලාව යටතේ වැය විෂයය අංක 2 ක් සඳහා 2019 අයවැය ප්‍රතිපාදන මගින් පිළිවෙලින් රු.මිලියන 200 ක සහ රු. මිලියන 30 ක ප්‍රතිපාදනයක් සලසා ගෙන තිබුණු නමුත් පිළිවෙලින් එයින් රු.මිලියන 84.80 ක් හා රු. මිලියන 29.76 ක් හෙවත් සියයට 42 ක් හා සියයට 99 ක්ම ඉතිරිව පැවතුණි. | - එම - | ප්‍රසම්පාදන කටයුතු නිම කර ඇති බවත් මුදල් නිරවුල් කිරීමට පාකිස්ථානු බැංකුව තහවුරු නොකල බැවින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු බව දක්වා තිබුණි. |
| (ඊ) | අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා නොගත් වැය විෂයක් සඳහා රු. මිලියන 100 ක් පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් වර්ෂය අවසාන වන විට රු. මිලියන 97.04 ක් හෙවත් සියයට 97.04 ක්ම ඉතිරිව පැවතුණි. | - එම - | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රමාණවත් සිසුන් ප්‍රමාණයක් සහභාගී කරවීමට අපොහොසත් වූ බව සහ ද්‍රවශීල මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබුණු බව දක්වා තිබුණි. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94(1) පරිදි දරන ලද බැරකම සහ වැය ප්‍රමාණය කිසිම විටක වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතු බව දක්වා ඇතත් සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වැය විෂයන් 03 කට අදාළව රු. මිලියන 30.09 කින් ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳීම් සිදු නොකල යුතු වීම | ඉදිරියට රැගෙන එන ලද බැඳීම් හා බැරකම් නිරවුල් කිරීමට ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මේ සඳහා හේතුවූ බව දක්වා තිබුණි. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ වැඩ සටහන් හා ව්‍යාපෘති කාර්යයන් 44 ක් ඉටු කරවා ගැනීම සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 07 ක් විසින් රු.මිලියන 864.02 ක මුදලක් 2019 වර්ෂයේදී ලබා දී තිබුණු අතර ඉන් වැය | පවරන ලද කාර්යයන් නිසි පරිදි ඉටු කිරීමට නිසි සැලසුම් කාලීනව | 2019 දෙසැම්බර් 31 දිනට අදාල කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය සියයට 78 ක් බව දක්වා තිබුණි. |

| | |
|---|---|
| කර තිබුණු ප්‍රතිපාදන මුදල් ප්‍රමාණය රු මිලියන 672.45 ක් වූයෙන් රු.මිලියන 191.57 ක් හෙවත් ප්‍රතිපාදන මුදලින් සියයට 22 ක්ම වැයකර නොතිබුණි. තවද අපේක්ෂිත වූ කාර්යයන් 44 න් 12 කම ප්‍රතිපාදන මුදල් කිසිවක් උපයෝජනය කර නොතිබුණි. | ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කල යුතු වීම. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව රු. මිලියන 62.87 ක්වූ හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට පැවත එමින් ඇතත් එම ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 4 වන ඡේදයේ නියමයන් පරිදි ක්‍රියාකිරීම. | හිඟහිටි ණය ශේෂ අයකර ගනිමින් පවතී. |

**2.6 තැන්පත් ශේෂයන්**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව තැන්පත් කළ දිනට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීම හෝ ආපසු ගෙවීම සිදු කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දිනට වසර 2 ඉක්මවූ රු. මිලියන 1.10 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. | නිරවුල් කිරීමට පියවර ගනිමින් පවතින බව දක්වා තිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 වත්කම් කළමනාකරණය**

----------------------------

පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදා 01 වන පොදු සේවා බලකාය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වියලි ආහාර ගබඩාව පරීක්ෂාවේදී වියලි හා සිසිල් පරිසර තත්ත්වයක ගබඩා කර තැබිය යුතු රු. මිලියන 102.02 ක් වටිනා අයිතම | ආහාර වර්ගවල ගුණාත්මකභාවය ආරක්ෂා වන අයුරින් | කිසිදු ගැටළුවක් මේවන තෙක් පැනනැගී නොතිබුණු බවත්, ගබඩාව ශීත ගබඩාවක් බවට |

| | | | |
|---|---|---|---|
| | 11 ක් සම්පූර්ණයෙන් ආවරණය කරන ලද උෂ්ණත්වය අධික ගබඩාවක් තුල ගබඩා කර තිබුණි. | ගබඩා කිරීමට කටයුතු කළ යුතුය. | පරිවර්තනය කිරීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කරන බවත් දක්වා තිබුණි. |
| (ආ) | 2020 පෙබරවාරි 19 දිනට යාන්ත්‍රික ප්‍රවාහන I ගබඩාවේ 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුල ලැබී තිබුණු එකතු වටිනාකම රු. මිලියන 4.25 ක් වූ අයිතම 188 ක ඒකක 2,489 ක් නිකුත් කර නොතිබුණි. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගෙන මිලදී ගැනීමට කටයුතු කල යුතුය. | මෙම යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් අයිතමවලට අදාල වාහන භාවිතයෙන් ඉවත්වීම සහ එම අමතර කොටස් පවතින වාහන සඳහා නොගැලපීම මේ සඳහා හේතුවී තිබුණු බව දක්වා තිබුණි. |
| (ඇ) | 2020 පෙබරවාරි 19 දිනට යාන්ත්‍රික ප්‍රවාහන II ගබඩාව තුල රු. මිලියන 0.63 ක එකතු වටිනාකමක් සහිත බැටරි 74 ක් පැවති අතර ඉන් 2013 හා 2014 වර්ෂවලදී මිලදී ගෙන ගබඩාවට ලැබී තිබුණු එකතු වටිනාකම රු. මිලියන 0.41ක් වූ බැටරි 56 ක ජීව කාලය අවසන්ව ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගෙන මිලදී ගැනීමට කටයුතු කල යුතුය. | වෙනත් ගබඩාවකින් මෙම ගබඩාවට බැටරි ලැබුණු බවත්, එසේ ලැබෙන විට වගකීම් කාලය අවසන් වීමට ආසන්නව තිබුණු බවත් වර්තමානය වන විට කල් ඉකුත් වී ඇති නිසා මෙම බැටරි නිකුත් කිරීමට නොහැකි වී ඇති බවත් දක්වා තිබුණි. |
| (ඈ) | 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල යාන්ත්‍රික ප්‍රවාහන ගබඩාවට ලැබී තිබුණු රු. මිලියන 3.20 ක් වටිනා ටයර්, ටියුබ් සහ ඒ හා අදාල භාණ්ඩ වර්ග 22 ක ඒකක 329 ක් ගබඩාවේ ඉතිරිව පැවතුණි. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගෙන මිලදී ගැනීමට කටයුතු කල යුතුය. | මෙම අමතර කොටස්වලට අදාල වාහන සීමිත සංඛ්‍යාවක් පමණක් පවතින බැවින් මෙම අමතර කොටස් තොග ඉතිරි වී ඇති බව දක්වා තිබුණි. |
| (ඉ) | එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී කටයුතු සඳහා මිලදී ගෙන තිබුණු රු.මිලියන 0.85ක් වටිනා එල් ඇන්ගල් යකඩ බාර් තොගයක් 2018 නොවැම්බර් 22 දින සැපයුම් ප්‍රවාහන II ගබඩාවට ලැබී තිබුණු නමුත් ඒවා ගබඩා පරිශ්‍රයේ එළිමහනේ කොරිඩෝව තුල ගොඩගසා තිබුණු බැවින් ඒවායින් බොහෝමයක් මලකෑමට ලක්ව තිබුණි. | නිවැරදි අවශ්‍යතාවයන්ට අනුව මිලදී ගෙන භාවිතයට ගැනීමට පියවර ගත යුතුය. | මෙම යකඩ වල දිග අනුව ගබඩාවල ගබඩා කල නොහැකි වූ බවත් මේ වන විට ගබඩාවල ස්ථානගත කිරීමට කටයුතු කරමින් සිටින බවත් දක්වා තිබුණි. |

**3.2 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2019 වර්ෂය තුල අලාභ අයකර ගැනීම්, කපා හැරීම් හා අත්හැරීම් සිද්ධි 120 ක් වූ අතර ඒවායෙහි වටිනාකම රු.මිලියන 47.11 ක් විය. 2019 දෙසැම්බර් 31 දිනට තව දුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට සිද්ධි 172 ක් පැවති අතර ඒවායෙහි වටිනාකම රු. මිලියන 14,368.75 ක් විය. මේ අතර වර්ෂ 10 ක් ඉක්ම වූ වටිනාකම රු.මිලියන 675.68 ක් වූ සිද්ධි 72 ක් ද, වර්ෂ 5-10 අතර වූ වටිනාකම රු. මිලියන 77.37 ක් වූ සිද්ධි 38 ක් ද, වර්ෂ 05 කට අඩු වටිනාකම රු. මිලියන 13,165.70 ක් වූ සිද්ධි 62 ක්ද විය.<br>තවද, 2016 දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාලාව කඳවුර තුල සිදු වූ ගිනි හානියේ තක්සේරු අගය රු.මිලියන 12,829.23 ක් වූ අතර, ඉන් රාජ්‍ය දේපලවල වටිනාකම රු.මිලියන 12,817.76 ක් විය. එය තවදුරටත් කපා හැරීමට හෝ අත් හැරීමට ඇති පාඩු තුල ඇතුලත්ව තිබුණි. | පොත් වලින් කපා හැරීමට හෝ අත්හැරීමට හෝ අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් සිදු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. | කඩිනමින් අදාල නිරවුල් කිරීමේ කටයුතු සමථයකට පත් කිරීමට ක්‍රියා කරන බව දක්වා තිබුණි. |

**4.** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **4.1 ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බල සේනාවේ සහ ස්වේච්ඡා බල සේනාවේ කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත පරිදි විය.** | කාලීනව ගැලපෙන පරිදි අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීම හෝ කාර්යය මණ්ඩලය සුදුසු පරිදි බඳවා ගැනීමට ක්‍රියා කිරීම. | අදහස් දැක්වීම් කර නොතිබුණි. |

| විස්තරය | | අනුමත සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නිත්‍ය බලසේනාව | නිලධාරී | 7,760 | 7,132 | 628 |
| | සෙසු නිළ | 119,704 | 101,053 | 18,651 |
| ස්වේච්ඡා බලසේනාව | නිලධාරී | 2,899 | 2,050 | 849 |
| | සෙසු නිළ | 70,149 | 56,012 | 14,137 |
| **එකතුව** | නිලධාරී | **10,659** | **9,182** | **1,477** |
| | සෙසු නිළ | 189,853 | 157,065 | **32,788** |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **4.2 ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය කරනු ලැබූ සිවිල් කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.** | කාලීනව ගැලපෙන පරිදි අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීම හෝ කාර්යය මණ්ඩලය සුදුසු පරිදි බඳවා ගැනීමට ක්‍රියා කිරීම. | අදහස් දැක්වීම් කර නොතිබුණි. |

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | - | - | - |
| තෘතියික මට්ටම | 19 | 11 | 8 |
| ද්විතියික මට්ටම | 204 | 146 | 58 |
| ප්‍රාථමික මට්ටම | 9,575 | 9,963 | 960 |
| අනියම්/කොන්ත්‍රාත් | 1,348 | | |
| **එකතුව** | **11,146** | **10,120** | **1,026** |